සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/05/AD 1 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2024.05.17 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු,
දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරු,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ සමිති කළමණාකරුවන්,

**<u>ශ්‍රී බු.ව. 2568 වන රාජ්‍ය වෙසක් මහෝත්සවය හා බුද්ධරශ්මි වෙසක් මංගල්‍යය - 2024</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අංක MWCA& SE/ADM/1/අ.ම.නි. ( තාවකාලික) 2024.05.10 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ජනාධිපති කාර්යාලය නිකුත් කර ඇති බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලිපියේ තුන්වන ඡේදයේ සඳහන් පරිදි 2024.05.21 දින සිට 2024.05.27 දින දක්වා වෙසක් සතිය තුළ ඔබ ආයතනය තුළ වෙසක් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. ඉහත අදාළ ලිපි මේ සමඟ යොමු කරමි.

04. මෙම වැඩසටහන සඳහා ප්‍රජාමූල බැංකුවල ප්‍රවර්ධන හා ප්‍රචාරන සඳහා අරමුදලෙන් රුපියල් 10000.00ක උපරිමයට යටත්ව වියදම් දැරීමට අනුමැතිය ලබා දෙන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සි.ඩි.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් -**

01. ලේකම්- කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - ක.දැ.ගැ.පි


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |

(1)

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர்,சிறுவர் அலுவல்கள் மற்றும் சமுகவலுப்படுத்துகைஅமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය. / எனது இல. / My No: MWCA&SE/ADM/1 /අ.ම.නි.(තාවකාලික)

ඔබේ අංකය. / உமது இல.:

දිනය. / திகதி / Date: 2024.05. 10

1. අතිරේක ලේකම් - (සංවර්ධන I)
2. අතිරේක ලේකම් - (සංවර්ධන II )
3. අතිරේක ලේකම් - (සංවර්ධන III)
4. අධ්‍යක්ෂ ජනරාල් - (ක්‍රමසම්පාදන)
5. අධ්‍යක්ෂ ජනරාල් - සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සමාජ සංවර්ධන ආයතනය
8. ප්‍රධාන මූල්‍ය නිලධාරි
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන අංශය.
10. අධ්‍යක්ෂ - අබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය
11. අධ්‍යක්ෂ - ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
12. අධ්‍යක්ෂ - සමාජ සේවා දෙපාර්තමේන්තුව
13. අධ්‍යක්ෂ උපදේශන - උපදේශන අංශය
14. අධ්‍යක්ෂ - ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පුහුණු ආයතනය
15. සමාන්‍යාධිකාරී - සමාජ ආරක්ෂණ මණ්ඩලය.

(Stamps: 13 MAY 2024; 14 MAY 2024; 13 MAY 2024)

**ශ්‍රී බු.ව.2568 වන රාජ්‍ය වෙසක් මහෝත්සවය හා බුද්ධරශ්මි වෙසක් මංගල්‍යය - 2024**

උක්ත කරුණට අදාළව බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ අංක MBRCA/01/07/12/01/2024 හා 2024.03.20 දිනැති ලිපිය හා ජනාධිපති ලේකම්ගේ අංක PS/FID/FS/Vesak/01 හා 2024.03.28 දිනැති ලිපි කෙරෙහි ඔබේ අවධානය මෙයින් යොමු කරමි. (අදාළ ලිපිවල පිටපත් මෙ සමඟ අමුණා ඇත.)

02.ඒ අනුව බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ලිපියේ 3 වන ඡේදයේ සඳහන් පරිදි 2024.05.21 සිට 2024.05.27 දක්වා වෙසක් සතිය තුළ ඔබ ආයතනය තුළ ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස දන්වන අතර,එසේ ක්‍රියාත්මක කිරීමට අදහස් කරන වැඩ විස්තරය මා වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමි.

03.ජනාධිපති ලේකම් විසින් යොමු කරන ලද ලිපියේ 03වන ඡේදයේ සඳහන් පරිදි වෙසක් සතියේ එක් දිනක සතිමත් භාවනා වැඩ සටහනක් ද පැවැත්වීමට කටයුතු කරන ලෙස දන්වමි.එම වැඩසටහනේ ඡායාරූප සහිත වාර්තාවක් සමාජසවිබලගැන්වීම් අංශයේ දුරකථන අංක 0778709039 වෙත වට්ස්ඇප් මඟින් එවීමට කටයුතු ලෙස කාරුණිකව දන්වා සිටිමි.

රාධා නානායක්කාර
අතිරේක ලේකම් (පරිපාලන)
ලේකම් වෙනුවට

පිටපත
01.ආර්.ක්‍රිෂ්ණි මිය - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.
(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)

| | කාන්තා ,ළමාකටයුතු | සමාජසවිබලගැන්වීම |
|---|---|---|
| ...ලේකම් /செயலாளர்/Secretary: 011-2186057 | | |
| ...කාර්යාලය/அலுவலகம்/office | 011-2883525 / 011-2186055 | 011-2887349-51 |
| ...ෆැක්ස්/பெக்ஸ்/Fax | 011-2187249 | 011- 2187007 |
| ...ඊමේල්/மின் தபால்/Email: | secretary@childwomenmin.gov.lk | wcasesecretary@sltnet.lk |
| ...වෙබ් අඩවිය/இணையத்தளம்/Website: | www.childwomenmin.gov.lk | www.stateminsamurdhi.gov.lk |

05 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල.
05 ஆம்மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமு
05th Floor, Stage II, Sethsiripaya,Battaramulla

01 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල
01ஆம்மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை.
01st Floor, Stage II, Sethsiripaya,Battaramulla.

නිහඬනොවන්න - දරුවන්රැකගන්නකුරල් கொடுங்கள் - பிள்ளைகளைக் காப்பாற்றுங்கள்Raise your voice to protect children

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs

මගේ අංකය / எனது இல. / My No. MBRCA/01/07/12/01/2024 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024.03. 20

රහසයයි

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය:MBRCA/01/07/2024/CP/03

අමාත්‍ය මණ්ඩල සංදේශය

**ශ්‍රී බු.ව.2568 වන රාජ්‍ය වෙසක් මහෝත්සවය**

**1.0** පසුබිම

1.1 බෞද්ධ ජනතාවගේ ශාස්තෘන්වහන්සේ වූ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ඉපදීම, බුදුවීම, පිරිනිවීම යන කරුණු සිහිකිරීමේ තෙමඟුල් දිනය වන වෙසක් දිනය ලෝකවාසී බෞද්ධ ජනතාව ඉමහත් ගෞරවයෙන් යුතුව සමරනු ලබයි. ක්‍රි.පූ.236 වැන්නෙහි දී දෙවන පැතිස් රජ දවස සම්බුදු දහම මෙරටට ලැබුණු දින සිට අයිරිමත් සම්බුදු තෙමඟුල සැමරීම රාජ්‍ය අනුග්‍රහය ඇතිව සිදුකළ බව මහාවංශය, දීපවංශය ආදී වංශ කතා සාක්ෂ්‍ය දරයි. දෙවන පැතිස් රජුගේ දෙවන රාජාභිෂේකය සිදුකරන ලද්දේ වෙසක් පුර පසළොස්වක පොහෝ දිනක බවත් එතැන් පටන් සම්බුද්ධ තෙමඟුල රාජ්‍ය අනුග්‍රහය ඇතිව සමරනු ලබන බවත් එහි සඳහන්ය. දුටුගැමුණු රජ දවස පටන් භාතිය, සද්ධාතිස්ස, උත්තිය, භාතිකාභය, වෝහාරිකතිස්ස, ගෝඨාභය, ජෙට්ඨතිස්ස, සේන, පළවෙනි පරාක්‍රමබාහු ආදී බොහෝ රජවරුද වෙසක් තෙමඟුල සැමරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදුන් බව වංශකතාවල සඳහන් වේ.

1.2 ශ්‍රී ලංකාවාසීන් ද ඉතා උතුම් කොට මෙම සම්බුදු තෙමඟුල සමරනු ලබයි. මෙවරද ත්‍රෛනිකායික මහානායක ස්වාමීන්වහන්සේලාගේ සහ සමස්ථ ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුශාසනා පරිදි උන්වහන්සේලාගේ ආශිර්වාදයෙන් ගරු ජනාධිපතිතුමන්ගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ උපදෙස් පරිදි අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සහ ආරක්ෂක අංශ වලද සහාය ඇතිව ලෝකවාසී බෞද්ධ ජනතාව සමඟ එක්ව ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ට මූලිකත්වය ලබාදෙමින් මෙවර රාජ්‍ය වෙසක් උත්සවය අතිඋත්කර්ෂවත් අන්දමින් සැමරීමට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවත් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

**2.0** සාධාරණීකරණය

2.1 අතිගරු මහානායක ස්වාමීන්වහන්සේලාගේ සහ සමස්ථ ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ නිර්දේශ පරිදි බු.ව.2568 (2024) රාජ්‍ය වෙසක් උත්සවය බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව එක්ව මාතලේ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීම සුදුසු බවට හඳුනාගෙන ඇත. ඊට අනුකූලව රාජ්‍ය වෙසක් උත්සවයේ සමාරම්භක උළෙල මාතලේ ධර්මරාජ පිරිවෙන් පරිශ්‍රයේදීත් එහි සමාප්ති උළෙල පල්ලේපොල ප්‍රාදේශීය ලේකම්

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07. இல. 135, ஸ்ரீமான் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
No. 135, Sreemath Anagarika Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
කාර්යාලය / அலுவலகம் / Office 011 - 2307694, 011 - 2307074 ෆැක්ස් / தொலைநகல் / Fax 011 - 2307688, 011 - 2300513 වෙබ් අඩවිය / இணையத்தளம் / Website http://www.mbs.gov.lk විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail info@mbs.gov.lk ලේකම් / செயலாளர் / Secretary 011 - 2307430, Fax : 011 - 2307406

කොට්ඨාශයේ මිල්ලවාන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථාන පරිශ්‍රයේදීත් පැවැත්වීමට සියලු පාර්ශ්වයන් විසින් එකඟවී ඇත. එමෙන්ම පහත තේමාව යටතේ රාජ්‍ය වෙසක් මහෝත්සවය දිවයින පුරා අතිඋත්කර්ෂවත් අන්දමින් සැමරීමට කටයුතු සැලසුම් කර ඇත.

ශ්‍රී බු.ව.2568 වන රාජ්‍ය වෙසක් මහෝත්සවයේ තේමාව

"අත්තනො ව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච"

**(අනුන් කළ දේ නොව තමන් කළ දේ ගැන විමසිලිමත් වෙමු)**

2.2 මාතලේ දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කින් ද, ශාසනාරක්ෂක මණ්ඩල විහාරස්ථාන 457කින් ද, දහම් පාසල් 385 කින් ද සමන්විතය. දිස්ත්‍රික්කය පුරා වැඩ සිටින ස්වාමීන්වහන්සේලා ගණන 1200 කි. සිල්මාතාවන් සංඛ්‍යාව 66කි. දහම් පාසල් දරුවන් 63711 ක් ද, දහම් පාසල් ගුරුභවතුන් 4120 ක් ද වෙති. මෙම දිස්ත්‍රික්කය සිංහල, දෙමළ, මුස්ලිම් ජනකොටස් වලින් ද බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික ආගමිකයන්ගෙන් සමන්විත ශාසනික වශයෙන් මෙන්ම භූගෝලීය වශයෙන් ද ඉතා වැදගත් දිස්ත්‍රික්කයකි.

2.3 මේ සම්බන්ධයෙන් මාතලේ දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලය, අන්‍යාගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේලා, දිස්ත්‍රික් දේශපාලන නායකත්වය, දිස්ත්‍රික් ලේකම් ප්‍රමුඛ නිලධාරීන් සමඟ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවත් සාකච්ඡාවක් 2024.03.14 දින පවත්වන ලදී. එමෙන්ම රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීම පිළිබඳව ගරු ජනාධිපතිතුමාගේ දැනුම් දීම පරිදි 2024.03.20 දින ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සමස්ථ ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති/ලේකම් ස්වාමීන්වහන්සේලාගේත්, අමාත්‍යාංශ ලේකම්වරු, ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අනුග්‍රාහක ආයතන ප්‍රධානීන් සහභාගිත්වයෙන් විශේෂ සාකච්ඡාවක් පවත්වා අවශ්‍ය සංවිධාන කටයුතු සැලසුම් කර ඇත. එහිදී පසුගිය වසරවල මෙන් සම්ප්‍රදායික ලෙස වෙසක් උළෙල සැමරීම සතියකට පමණක් සීමා නොකර, එහි වත්පිළිවෙත් සහ ආගමික වැඩසටහන් වෙසක් උළලෙන් පසුවත් ඉදිරියට ගෙනයා හැකි වැඩපිළිවෙලක් ලෙස පවත්වාගෙන යාමටත් සියලු ආගම්වල සහාය ඇතිව කටයුතු කිරීමත් සුදුසු බවට තීරණය විය.

**3.0 යෝජනා**

මාතලේ ධර්මරාජ පිරිවෙන් පරිශ්‍රය සහ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිල්ලවාන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථාන පරිශ්‍රය කේන්ද්‍රකර ගනිමින් පැවැත්වෙන බු.ව.2568 (2024) රාජ්‍ය වෙසක් මහෝත්සවය වෙනුවෙන්,

3.1 2024 වර්ෂයේ මැයි මස 21 දින සිට 27 දින දක්වා වෙසක් සතිය ප්‍රකාශයට පත් කිරීම.

3.2 වෙසක් සතියට අයත් 2024 මැයි මස 22, 23 හා 24 දිනයන්හිදී සත්ත්ව ඝාතන හා මස් මාංශ අලෙවිය වළක්වාලීම සඳහා සුපිරි වෙළඳසැල් ද ඇතුලත්ව මස් මාංශ අලෙවි කරනු ලබන ස්ථාන ද, සුරා සැල් ඇතුළු මත්ද්‍රව්‍ය අලෙවි ස්ථාන සහ සමාජ ශාලා වසා තැබීමට කටයුතු කිරීම.

3.3 සමස්ථ ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුශාසනා පරිදි රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වෙන මාතලේ දිස්ත්‍රික්කය තුළ ප්‍රමුඛවද සමස්ථ රටවාසීන්ටද සහභාගීවිය හැකිවන

පවිදි මුළු දිවයින පුරාම වෙසක් සතියේ එක් එක් දිනයන්හිදී පහත තේමාවන් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| | |
|---|---|
| 2024 මැයි 21 | රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමී සංස්කෘතික වැඩසටහන් |
| 2024 මැයි 22 | පරිසර සංරක්ෂණ හා යහපත් සෞඛ්‍ය පුරුදු වැඩසටහන් |
| 2024 මැයි 23 | සීල භාවනා පින්කම (වෙසක් පුන්පොහෝ දින වැඩසටහන) |
| 2024 මැයි 24 | සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් |
| 2024 මැයි 25 | සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සම්බුද්ධ දේශනා අනුව පවත්වන වැඩසටහන් |
| 2024 මැයි 26 | අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් |
| 2024 මැයි 27 | භික්ෂු හා සිල් මාතා පුහුණු වැඩසටහන් |

3.4 මාතලේ දිස්ත්‍රික්කය බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික ජනතාව සම්මිශ්‍රණය වූ දිස්ත්‍රික්කයක් බැවින් බෞද්ධ දර්ශනය, සමානාත්මතාවය, යහපැවැත්ම, ඉවසීම යන ගුණාංග ප්‍රවර්ධනය කරමින් එක් එක් ආගම් පිළිබඳවත්, පූජනීය ස්ථාන පිළිබඳවත් දැනුම හුවමාරුකර ගැනීම සඳහා ඒකාබද්ධ ආගමික වැඩසටහන් මාතලේ දිස්ත්‍රික්කය ඇතුළු දිවයිනේ සියලු දිස්ත්‍රික්කයන් පුරා ක්‍රියාත්මක කිරීම.

3.5 රාජ්‍ය වෙසක් මහෝත්සවය බෞද්ධ ප්‍රබෝධය උද්දීපනය වන අවස්ථාවක් බැවින් රජයේ හා පෞද්ගලික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් මඟින් එම වැඩසටහන් සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දීම.

3.6 මෙම අතිඋත්කර්ෂවත් වෙසක් සතිය තුල සියලුම පාසල් ඇතුළු රජයේ හා පෞද්ගලික ආයතන සහ නිවාස වල බෞද්ධ කොඩිය ප්‍රදර්ශනය කිරීමටත්, බුද්ධාලම්භන ප්‍රීතිය වඩවන පරිදි පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කරමින් සැරසිලි සිදුකිරීමට ජනතාව වෙත මහ පෙන්වීමටත්, මෙම සතිය තුළ දිවයින පුරා ක්‍රියාත්මක වැඩසටහන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු සියලු අමාත්‍යාංශ මෙන්ම පළාත් සභා සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අනුග්‍රහය ලබා ගැනීමටත් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් චක්‍රලේඛයක් නිකුත් කිරීම.

**4.0** අනුමැතිය

බුදුන් වහන්සේගේ සම්බුදු තෙමඟුල සිහිකිරීම සඳහා ලෝකවාසී බෞද්ධ ජනතාව සමඟ එක්වන ශ්‍රී ලාංකික ජනතාවගේ බෞද්ධ ප්‍රබෝධය වර්ධනය කිරීම සඳහා රාජ්‍ය වෙසක් මහෝත්සවය පැවැත්වීම වෙනුවෙන්,

4.1 ඉහත අංක 3.1 සිට **3.6** දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීමත්,

4.2 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් රජයේ සියළු අමාත්‍යාංශ සහ ආයතන වෙත චක්‍රලේඛයක් නිකුත් කිරීමත්,

නිර්දේශ කර අමාත්‍ය මණ්ඩලයේ කාරුණික අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

විදුර වික්‍රමනායක **(පා.ම.)**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය